# නිදහස් තැනැත්තෙක් වන්න.

# Be A Free Man.

මකුළු දැලක පැටලුණු මැස්සෙකු ඔබ දැක තිබේද? ඌ කුරුකුරු හඬක් නගමින් ඉතා වේගයෙන් දඟලන්ට පටන් ගනී. මැස්සාට ඇත්තේ එකම අභිප්‍රායකි. ඒ දැලෙන් නිදහස් වීමයි. ඒ කුඩා සතාමියා එතරම් දැඩි කුරිරු ග්‍රහණයකට හසු වී ඇති බව නොදන්නවා නම් උගේ ඒ අධිෂ්ඨානයත් ශක්තියත් ගැන ඔබ උදම් වනවා ඇත. එහෙත් උගේ හැසිරීම් විලාසයෙන් ප්‍රකාශ වන්නේ ඛේදවාචකයක ස්වභාවය පමණක් බව ඔබ දන්නෙහිය. අන්තිමේදී මැස්සාගේ ශරීර ශක්තිය හීන වූ විට මකුළුවා පැමිණ දැලේ ඉරී ගිය තැන් සවිමත් කොට වියා එකම දළ පහරකින් ඌ ජීවිතක්ෂයට පත්කරන්නේය. අසරණ මැස්සා ඒ මකුළුවාගේ මීළඟ භෝජනය රසවත් කරන අලුත් මසක් බවට පත් විය.

නිදහස යනු අති උතුම් සර්වසාධාරණ නියමයකි. මිනිසුන් නිදහස වෙනුවෙන් සිය ජීවිතය පරදුවට තැබූහ. ජීවිතය පූජා කළහ. මිනිසකුට දියහැකි ඉතාම දැඩි දඩුවම නම් ඔහුගේ නිදහස නැති කිරීමයි. ඔබ නිදහස් ද? දෙවියන්වහන්සේත්, මිනිසාත් සමග සාමයෙන් ලොව සැරිසැරීමට ඔබට හැකිද? යක්ෂයා තම උගුලට ඔබ හසුකරගන්නට උත්සාහ කරනවා ඇත. පාපය නැමැති සියුම් දැළක් ඔහු විසින් විටෙක කා හටත් නොපෙනෙන ලෙසකට ලෝකය හරස්කොට වියා තිබේ. බයිබලය මෙසේ ප්‍රකාශ කරයි. (The Bible Says) ..... සිහිඇතුව, අවදිව, ඉඳිල්ලා. නුඹලාගේ විරුද්ධකාරයා වූ යක්ෂයා ගොරවන සිංහයකු මෙන් කවරකු ගිලිම්දෝහෝයි සොයමින් ඔබමොබ ඇවිදින්නේය. **(1 පේත්‍රුස් 5:8)**

ඔබ ඒ යක්ෂයාගේ ගොදුරක් නොවිය යුතුය. දැනුත් ඔබ වටා ඇති පාපය නැමැති දැළ සමහර විට ඔබට නොපෙනෙනවා විය හැකිය. පාපය සමහර විටෙක සුළු දෙයකැයිද නිරුපද්‍රිත යයි ද, ඔබට සිතෙන්නට පුළුවන. එහෙත් ඔබ දැලේ පැටලී ඇති බව වටහා ගන්නට වැඩි කලක් ගත නොවනු ඇත. එනමුදු ඒ වන විට නිදහස ඔබ ළඟ නැත. ඔබ පාපිෂ්ඨයාගේ බැම්මට හසු වී හමාරය. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පැමිණ ඇත්තේ ඔබ නිදහස් කිරීමටය. පාපයන් රැසකට ගොදුරු වූ මිනිසකු ගැන බයිබලයේ සඳහන් වේ. භූතයෝ (යක්ෂ ආත්ම) ඔහු තුළ පදිංචි වූහ. තමන්ගේ කැමැත්තට වැඩ කිරීමට ඔහුට නිදහසක් තිබුනේ නැත. යක්ෂයෝ ඔහුට ආරූඪව සිටියහ. ඔහු රුදුරු මිනිසකු බවට පත්කළේ යක්ෂයන්ය. දම්වැලකින් පවා ඔහු තවත් නවත්වන්ට කිසිවකුට නුපුළුවන් විය. ...... ඔහු දමනය කරන්නට කිසිවකුට ශක්තියක් නොවීය. ඔහු නිතරම රෑ දවල් මොරගසමින්ද ගල්වලින් කපා ගනිමින් ද සොහොන් ගෙවල්හීත් කඳුවලත් සිටියේය. **.... (මාර්ක් 5:3-5)**

මිනිස්සු ඔහුට බිය වූහ. ඔහුගේ ශරීරය නිදහස්ව තිබූ නිසා කඳුපල්ලම්වල දුවපැන ඇවිදීමට ඔහුට පිළිවන් විය. එහෙත් පාපය නැමැති කඳවුර තුළ ඔහුගේ ආත්මය සිරකර තබා බැඳ දමා තිබිණි. නිදහස්වීමට දඟලන ඔහු ඉන් හෙම්බත් වූ විට යක්ෂයා පැමිණ ඔහු අඩපන කොට නිහඬ කරවීය. ඔහු යක්ෂයින්ගේ ජීවමාන ගොදුරක් බවට පත් විය. දිනක් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔහු විසූ රටට පැමිණි සේක. මේ මිනිසා උන්වහන්සේ කරා දිවගොස් වැඳ වැටුණේය. මිනිසාට අරක්ගෙන සිටි යක්ෂයෝ

තමන්ට හිරිහැර නොකරන ලෙස යේසුස් වහන්සේගෙන් අයැදි සිටියහ. යේසුස් වහන්සේ ඔවුන් පළවා හැරි සේක.

**(මාර්ක් 5:1 - 15 කියවන්න)**

අන්තිමේදී අපට දැකගත හැකි වුයේ මනා ඇඳුමින් සැරසී, තැන්පත්ව හිඳගෙන සිටි, සිහිබුද්ධියෙන් යුතු තැනැත්තෙකි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔහු නිදහස් කර ගත් සේක. ඔබ පාපයෙන් නිදහස්ව සිටිය යුතු බව දෙවියන්වහන්සේගේ කැමැත්තයි. ඔබ නිදහස් කිරීමට යේසුස් වහන්සේට බලය ඇත්තේය. "ස්වාමීන්වහන්සේගේ ආත්මය මා කෙරෙහිය. මක්නිසාද දිළිඳුන්ට ශුභ ආරංචිය දේශනාකරන්නට උන්වහන්සේ මා ආලේපකළ සේක. වහලුන්ට මිදීම සහ අන්ධයන්ට පෙනීම ලැබෙන බව ප්‍රකාශකරන්නට මඩිනාලද්දවුන් නිදහස් කර හරින්ටද ....." **(ලූක් 4:18)** පාපොච්චාරණය කොට යේසුස්වහන්සේට යාඥා කරන්න.

"අපට පාපය නැතැයි කියමුනම්, අපි අපම රවටා ගනිමුව, සැබෑවද අප තුල නැත. අපේ පාපවල් කියා දෙමුනම්, අපේ පව් අපට කමා කරන්නටත් සියළු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කරන්නටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක."

**(1 යොහාන් 1:8-9)**

යේසුස් වහන්සේ අදහාගත් යුදෙව්වරුන්ට කියනසේක.

..... මාගේ වචනයෙහි පවතිනවා නම්, සැබෑවට නුඹලා මාගේ ගෝලයෝය, නුඹලා සැබෑව දැනගන්නවා ඇත. සැබෑවද නුඹලා නිදහස් කරන්නේයයි කීසේක. ........ එහෙයින් යේසුස් වහන්සේ නුඹලා නිදහස්කරන්නේනම් සැබවින් නුඹලා නිදහස් වන්නහුය.

**(ශු යොහාන් 8:31-32 , 36)**

---

නිදහස ඔබ සඳහාය - ඔබ නිදහස් තැනැත්තෙකු වන්න.

**Freedom is for you - be a Free Man.**

**එක්සත් පෙන්ත කොස්ත සභාව,**
**නො. 1 ටෙම්ප්ලර් පෙදෙස, ගල්කිස්ස.**
**දුරකථන : 712615 , 716951**

http://www.sayadi-al-nas.ae
http://www.sayadi-al-nas.com
صيادي الناس

Apostolische Pfingstgemeinde Mannheim
Friedelsheimerstr. 18-20
D - 68199 Mannheim (Neckarau) /Germany
Pastor Raymond Wey
Assistent Pastor Sascha Wey
www.jesus-is-god.de, www.v-p-m.de